

# කුසුම්සිරි - යශෝධරා නැවත වේදිකාවේ
# පිං අකුණු Pin Akunu

**පාලිත ඉද්දමල්ගොඩ**

දැනට වසර කිහිපයකට උඩදී මෙල්බර්න් ඇතුළු ඕස්ට්‍රේලියාවේ ප්‍රාන්ත කිහිපයකම රඟ දැක්වී-මෙන් ශ්‍රී ලාංකිකයින්ගෙ ප්‍රසාදයට පාත්‍ර වූ, දඟයා හා පුංචි අන්දරේ නාට්‍ය වලින් අනතුරුව







දරුවන්ගේම රංගනයෙන් යුත් ළමා නාට්‍ය නිර්මා-ණයේ දිගු නිහැඬියාවක සිටි යශෝධරා සරච්ච-න්ද්‍ර, කුසුම්සිරි ලියනආරච්චි නිර්මාණවේදී ද්විත්වය දැනට මාස කිහිපයක සිටම මෙල්බර්න්වාසී දරු පිරිසක් සමගින් අලුත් වැඩකට සූදානම් වෙන බව මා දැන සිටි අතරම එය කරළියට නැංවෙන්නේ කවදාදැයි විමසිලිමත්ව බලා සිටියෙමි.

මේ නිර්මාණවේදී දෙපොළගේ පෙර විශිෂ්ට නිර්මාණ රස විඳි අයෙක් වූ නිසාවෙන්ම ඇතිවූ කුතුහලයකටත් වඩා, විදේශයක ජීවත් වෙන ලාංකික දරු දැරියනට ඔවුන් උරුමකම් කියන ලාංකීය කලා රසය හුරුක-රවන්නට තරම් හැකියාව ඇති ප්‍රවීණයන්ගේ නිහඬවීම නොවිය යුත්තක් බැවිණි ඒ. කෙසේ නමුත් මාස කිහිපයක වෙහෙසකර සූදානම් වීමකින් පසුව ඔවුන් ඒ අපූරු විනෝදාත්මක ළමා වේදිකා නාට්‍යය පිං අකුණු අගෝස්තු මස 27 වෙනිදින ග්ලැඩ්ස්ටන්පාර්ක් ද්විතීක පාසැල් රංග ශාලාවේ දී මුල්වරට වේදිකාගත කිරීමට සූදානමින් සිටින බව අසා බෙහෙවින් සතුටට පත්වීමි.

පසුගිය සති අන්තයේ මේ කුඩා දරු දැරියන් පුහුණුවීම් කටයුතු කරන ආකාරය දැක බලාගන්නට අවස්ථාවක් ලැබීමෙන් එහි ගිය මට අවංකවම දැනී ගිය කාරණය වූයේ පිං අකුණු අලංකෘත පිං අකුණු ළමා නාට්‍යය කුඩා දරුවන්ට මෙන්ම වැඩිහිටියන්ටද රසාස්වාදය ගෙනදෙන්නක් වන බව හැඟී ගියේ ඔවුන් පුහුණුවීම් කල සුළු කාල සීමාව තුල මා ද අපූරු විනෝදාස්වාදයක් ලැබූ බැවිණි. ළමා මනසට උචිත සරළ තේමාවක් ඔස්සේ දිගහැරෙන මෙම වේදිකා නාට්‍යය පුරාවටම දරුවන්ගේ සහජ හැකියාවන් ඉස්මතු වන ආකාරය මෙන්ම, කෘතහස්ථ ගුරු යුවළගේ ප්‍රතිභාවෙන් හැඩ වී ඇති ආකාරයද මනාව පෙන්නුම් කෙරෙන බව කිව හැකියි. මෙම නාට්‍යයේ කතා පිටපත පිළිබඳව මා විමසා බැලුවිට දැනගන්නට ලැබුණේ පිං අකුණු හි දිගහැරෙන මූලික කතාංගය මුල් වරට පිටපත්කරණය කරනු ලැබ ඇත්තේ ජයතුංග මිල්ලවිතානච්චි විසින් වන අතර එය යශෝධරා කුසුම්සිරි දෙපොළගේ දීර්ඝ ගමනකට මුල පිරිය හැකි තවත් අපූර්වතම නිර්මාණයක් වන බවයි. විවිධ කලා ක්ෂේත්‍ර හරහා මේ වනවිටත් මෙල්බර්න්වාසී ලාංකිකයින්ගේ ආදරය දිනා සිටින දක්ෂ දරු දැරියන් මෙන්ම කිසිදාක වේදිකාවක් ඇසුරු නොකළ දරු දැරියන් කිහිපදෙක් ද, යශෝධරා කුසුම්සිරි දෙපොළගේ නිවැරදි මගපෙන්වීම හා පුහුණුව යටතේ මෙම නාට්‍යය සඳහා රංගනයෙන් එක්වීමත් මෙහි විශේෂත්වයක්.

නම් වශයෙන් සඳහන් කරතොත් උදාර, සුධාර, සියෝදා, ෂෙහාරා, බිහංසා, බ්‍රියෙනා, බ්‍රිවිනි, යොමිත්, ආසභ, ඉන්ද්‍ර, පංචාලි, චනුම්, කවීශ, රන්‍යා, බෙනුෂි, තෙනුජය, විනද සහ ශෙවෝන් යන දරුවන්ද, බිමල්, නිරෝෂා සමග සඳමාල් යන වැඩිහිටියන්ද රංගණයෙන් දායක වන අතර තවත් වැඩිහිටි පිරිසක් සංගීතය සැපයීමෙන් ආලෝකකරණයෙන්, අංගරචනයෙන්, වේදිකා පසුතල නිර්මාණයෙන් මෙම නාට්‍යයට දායක වනු ඇත.

සියුම් උපහාස රසයෙනුත් ප්‍රහසනයෙනුත් නිශ්පාදනයක් ලෙසින් නවසීලන්තයේදී කලකට ඉහතදී වැඩිහිටි රංගවේදීන් විසින් රඟ දැක්වූ බවකි. මෙවර එය කුඩා දරුවන්ට සුදුසු අකාරයෙන් පිටපත් සංශෝධනය කර, යශෝධරා සරච්චන්ද්‍රයන් විසින් මුහුකරන ලද සම්ප්‍රදායික නාට්‍ය සංගීතයෙන් හැඩගන්වා ඉදිරිපත් කරනු ලබන්නේ කුසුම්සිරි ලියනආරච්චි විසිනි.

සිංහල බසින් කෙරෙන නාට්‍ය රංගණයක් ඕස්ට්‍රේලියාව වැනි රටක ඉංග්‍රීසි බසින් අකුරු කරන දරුවන්ට රසවිඳීමට හැකිද යන්න කාටත් මතුවන හැඟීමක්. පුහුණුවීම් කටයුතු නැරඹූ මට හැඟී ගියේ මෙවර ඔවුන් එම අභියෝගයද ජයගෙන ඇති සැටියකි.

ගීතවත්ව ගලායන මෙම නාට්‍යයේ සංක්ෂිප්තය ඉංග්‍රීසි පමණක් දන්නා දරුවකුට වුව තේරුම් ගත හැකි අයුරින් ඉංග්‍රීසි බසින් ගැයෙන ගීත කොටස්වලින් ද නාට්‍යය නිර්මාණය වී තිබීම විශේෂත්වයක් වන අතර එමගින් ඕනෑම දරුවකුට එය කිසිදු බාධාවකින් තොරව රසවිඳීමේ හැකියාවද ලැබෙනු ඇත.

ලාංකීය දේ අගයන විශාල පිරිසක් මෙල්බර්න් නුවර මා දැක ඇතිමුත් කුඩා දරුවන් ඒ සඳහා යොමුකිරීමට හෝ දරුවන්ට ලාංකීය දේ රසවිඳීමට ලැබෙන අවස්ථා විරල බව මගේ අත්දැකීමයි. මෙල්බර්න් නුවර අවුරුද්ද පුරාවටම සංවිධානය කෙරෙන නනාවිධ ප්‍රසංග හා කලා කටයුතු බොහොමයක්ම වැඩිහිටියන්ම කේන්ද්‍ර කොටගත් එවා වන අතර දරුවන් සඳහා වැඩසටහන් වේ නම් ඒ අතලොස්සක් පමණි. ඒ අතරිනුත් මෙවන් වූ නාට්‍යමය අත්දැකීමක් ලැබීමේ අවස්ථා නම් නොලැබෙන තරම්ය. කුමන සංස්කෘතික පසුබිමක හැදී වැඩුණත් කාලාව හා සාහිත්‍යය මගින් දරුවෙකුගේ මානසික සංවර්ධනයට කෙරෙන යහපත් බලපෑම අනාගතයේ යහපත් පිරිපුන් මනුෂ්‍යයෙකු බිහිවීමට මග පාදන බව අමුතුවෙන් කිවයුතු නොවේ. ඕස්ට්‍රේලියාව වැනි රටක කෙරෙන මෙවන් අගනා කලා නිර්මාණ ඉදිරියේදීත් බිහිවීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අපට හැකි දායකත්වය ලබාදීම අප කාගේත් යුතුකමක් බව මගේ හැඟීමයි.

ඔබේ ඒ දායකත්වය ලබාදෙමින් උසස් වින්දනයක් ලබා ගැනීමට.......

**ස්ථානය - Gladstone Park Secondary School Performing Arts Centre**
**දිනය - අගෝස්තු 27 සවස 6.30 ට**

**දෙවන රඟ දැක්වීම**
**ස්ථානය Cranbourne Community Centre**
**දිනය - සැප්තැම්බර් 10 සවස 6.30 ට**

